// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1834/15 - 2013 ඔක්තෝබර් මස 28 වැනි සඳුදා - 2013.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## අතුරු ව්‍යවස්ථා

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (VII) උප වගන්තියේ 'උ' ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා '(ආනුෂංගික විධිවිධාන)' පනතේ '2 වැනි වගන්තිය' (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*බදු අයකර ගැනීම සඳහා තොරතුරු ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථා පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

1A - PG 001809 — 350 (2013/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු ව්‍යාපාරික ස්ථාන හා කර්මාන්ත සම්බන්ධයෙන් බදු අයකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන්නාවූ ගිණුම් වාර්තාවලට අදාළ තොරතුරු ලබාගැනීමට අවශ්‍ය වාර වාර්තා ලබාගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා පනවනු ලැබේ.

03. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති සියලුම ව්‍යාපාර කර්මාන්ත හා සංවිධාන පිළිගත් ගිණුම් ක්‍රමයක් අනුව පැහැදිළි ගිණුම් වාර්තා පවත්වාගෙන යා යුතු ය.

04. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියා විසින් ඉල්ලුම් කරනු ලබන සියලුම මූල්‍ය හා ගිණුම්වලට අදාළ තොරතුරු ලබාදීම, පිටපත් ලබාදීම ව්‍යාපාර බද්දකට යටත් තැනැත්තෙකුගේ කාර්යය වන්නේය.

05. සභාපතිවරයා හෝ ඔහු විසින් බලය පැවරූ යම් නිලධාරියෙකු විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන සියලුම ව්‍යාපාර තොරතුරු හා මූල්‍ය ගිණුම් පිළිබඳ වාර වාර්තා පිළිගත් මූල්‍ය හා ගිණුම් සංකල්ප මත පිළියෙල කරනු ලබන එවා විය යුතුය.

06. ඉහත 05 වන අතුරු ව්‍යවස්ථාව මගින් ඉදිරිපත් කරන සියලුම මූල්‍ය හා ගිණුම් වාර්තා පිළිගත් ගිණුම් පරීක්ෂකයෙකු මගින් පරීක්ෂාවට ලක්කළ සහතික කරන ලද වාර්තා විය යුතුය.

07. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් බලය පැවරූ නිලධාරියා විසින් යවනු ලබන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින 14 ක් ඇතුළත එකී දැන්වීම් මගින් ඉල්ලා ඇති තොරතුරු ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

08. සත්‍ය තොරතුරු ලබාදීම හෝ තොරතුරු හෙළිදරවු නොකිරීම වරදක් වන්නේය.

09. ඉහත 05 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඉල්ලා සිටිනු ලබන වාර වාර්තාවලට අදාළ තොරතුරු පරීක්ෂා කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාළ ව්‍යාපාරික ස්ථානයට කර්මාන්ත පරිශ්‍රයට පැමිණ සභාපතිවරයාට හෝ බලය පැවරූ නිලධාරියාට එම පොත් පත්වල අවශ්‍යතාවය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

10. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළහැකි උපරිම දඩය සහ එම කඩ කිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩ කිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය (2) උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,
"බලයලත් නිලධාරි" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු අදහස් කෙරේ.

12. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

11 - 408/1

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**නගරයේ සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි වීථිවල මහජනයා විසින් සිදුකරනු ලබන සැරසිලි පාලනය කිරීම සහ විධිමත් කිරීම සඳහා පනවනු ලැබේ.

03. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගෙන් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව සභා බල ප්‍රදේශයේ කිසියම් ස්ථානයක සැරසිලි කිරීම නිත්‍යානුකූල නොවන්නේය.

04. මෙහි මින් මතු පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ හෝ බලය පවරන ලද නිලධාරියා නිකුත් කරන ලද අවසරපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි හා ප්‍රසිද්ධ ස්ථාන සැරසිලි කිරීම නොකළ යුතුය.

05. කවර හෝ සැරසිල්ලක් සඳහාම අවසරපත්‍රයක් ලබාගැනීමේදී මෙම අතුරු ව්‍යවස්ථාවේ 06 වන අතුරු ව්‍යවස්ථාව අනුව අයදුම්පතක් සැරසිලි කිරීමට යටත් පිරිසෙන් පැය 48 කට පෙර සභාවට ඉදිරිපත් කළ යුතුය.

06. සැරසිලි කරන වීථියේ හෝ ප්‍රසිද්ධ ස්ථානයේ නම :-
සැරසිල්ලේ ස්වභාවය :-
සැරසිලි කරන කාලසීමාව :-
සැරසිල්ල කුමක් අරභයාද යන වග :-
සැරසිල්ල ඉවත් කරගන්නා දිනය :-
ඉවතලන දෑ බැහැර කරන ආකාරය කෙසේද ? යන්න :-

07. අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු සැරසිලි සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අවසරපත්‍රයක් නිකුත් කරන ලැබේ.

08. සැරසිලි සඳහා කවර හෝ අවස්ථාවක පොලිතින් භාවිතා නොකළ යුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සෑම අවසර පත්‍රයක් සඳහාම රු. 500/- ක මුදලක් අවසරපත්‍ර ගාස්තු වශයෙන් අයකරනු ලැබේ.

අ. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ සෑම සැරසිලි කාර්යයක් සඳහාම රු.5000/- ක තැන්පතු මුදලක් සභාවේ තැන්පත් කළ යුතුය.

ආ. අවසරපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකු විසින් කරනු ලබන යම් සැරසිල්ලක් අවසරපත්‍රයේ සඳහන් සැරසිලි ඉවත් කළයුතු යැයි සඳහන් දිනයෙන් පැය 24 ක් තුල සැරසිලි ඉවත් කරනු නොලැබේ නම්, සභාව විසින් එම සැරසිලි ඉවත් කර, ඊට වැයවූ වියදම් අයකර යම් ඉතිරි මුදලක් දෙජස එය තැන්පත්කරු වෙත ආපසු ගෙවීම නීත්‍යානුකූල වන්නේය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරුණු අවමංගල්‍ය සැරසිලි සඳහා අදාළ නොවන්නේය.

11. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කරනු ලබන සැරසිල්ලක්, ප්‍රදේශයේ මාර්ග සංඥා පුවරු, ප්‍රදේශ සිතියම් හා නාමපුවරු වැසී යනසේ හෝ අවහිර වන සේ නොකළ යුතුය.

12. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තිය අනුව නියම කළ හැකිය. මේ යටතේ අයකරනු ලබන සියලුම දඩ මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැරකළ යුතුයි.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,
"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"සැරසිල්ලක් " යන්නෙන් යම් සිද්ධියක් හෝ යම් කාර්යයක් අරමුණු කරගත් කෘත්‍රිම හෝ ස්වභාවික ද්‍රව්‍යවලින් යුතුව, එම සිද්ධිය හෝ කාර්යය නියෝජනය කිරීම සඳහා තාවකාලිකව සකස් කරගනු ලබන උපක්‍රමයක්ද,
"නිලධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිලධාරීන්ද ඇතුළත් වේ.

11 - 408/2

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය උ⁹ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ක්‍රීඩාභූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩාභූමි පාලනය කිරීම සහ ගාස්තු අයකිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රීඩාභූමි පාලනය කිරීම සහ විධිමත් කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

03. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාභූමියක් ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ අවසර පත්‍රයක් ලබාගැනීමට අපේක්ෂා කරන යම් තැනැත්තෙකු විසින් මෙම ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබූ ආකෘති පත්‍රය සභාපතිවරයා වෙතින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් අයදුම් කළ යුතුය.

04. යම් විශේෂ උත්සව පැවැත්වීම්, ක්‍රීඩා තරඟ, සංදර්ශන, සැණකෙළියක්, රැස්වීමක් හෝ ඒ හා සමාන ස්වරූපයේ කටයුතු සඳහා ක්‍රීඩාපිටිය වෙන්කර ගැනීම සඳහා වන ඉල්ලීමකදී අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයට අනුකූල අයදුම්පත්‍රයක් මගින් අයදුම්පත්‍රය යටත් පිරිසෙන් සතියකට පෙර ඉල්ලීම කළ යුතුය.

(අ) ක්‍රීඩා භූමි ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ සෑම අයදුම්පත්‍රයක්ම සභාපතිවරයා විසින් එම අයදුම්පත්‍ර ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබුණු අනුපිළිවෙල සලකා බැලිය යුතු අතර, ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක්ම අනුමත කොන්දේසිවලට අනුව ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම කළහැකි අතර, අවස්ථාවෝචිත පරිදි සුදුසු යැයි හැඟෙන කොන්දේසියක් ද පනවා අවසර දීම ක්‍රියාත්මක කළ හැකිය.

(ආ) ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබාදීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට සභාපතිවරයා විසින් ගන්නා තීරණය නොපමාව ඉල්ලුම්කරුට දැන්විය යුතුය.

(ඇ) ක්‍රීඩාභූමිය පාවිච්චි කිරීමට දෙන්නේ නම් සභාව විසින් කලින් කලට තීරණය කර ගැසට්පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගාස්තු හා ඇප මුදල් ප්‍රමාණය ද දින 05 කට පෙර ගෙවන ලෙසට අයදුම්කරුට දැන්විය යුතුය.

(ඈ) ඉහත කී පරිදි නියමිත ගාස්තුව හා ඇප මුදල් අයදුම්කරු විසින් සභාපතිවරයා නියම කරනු ලැබ ඇති කාලසීමාව ඇතුළත ගෙවූ විට ක්‍රීඩාභූමි ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ අවසර පත්‍රයක් එකී අයදුම්කරුට නිකුත් කරනු ලැබිය යුතුය.

05. ඉහත අතුරු ව්‍යවස්ථාවේ කර්යයන්ට හැර මෙහි දැක්වෙන ආකාරයට හා මෙහි අඩංගු විධිවිධානවලට අනුකූලව ක්‍රීඩාභූමි ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ බලපත්‍රයක් තමා වසින් ලබාගෙන ඇත්නම් මිස කවර හෝ වේලාවක කවර හෝ කාර්යයක් සඳහා ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට ගැනීමට කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතුය.

06. ආපසු ගෙවීම් :-

(අ) ක්‍රීඩාභූමිය වෙන්කිරීම අවලංගු කරන බවට ලිඛිත දැන්වීමක් ක්‍රීඩාභූමි වෙන්කර ගත් දිනයට යටත් පිරිසෙන් අවම වශයෙන් දින තුනකට කලින් සභාපතිවරයාට ලැබුණහොත් මිස කිසිම ගාස්තුවක් එහි කොටසක් ආපසු ගෙවිය නොහැක.

(ආ) වෙන්කර ගැනීමක් අවලංගු කරන බවට නිසි දැන්වීමක් සභාපතිවරයාට ලැබී ඇති අවස්ථාවක ගෙවා ඇති ගාස්තුවලින් සභාවට වියදම්වී ඇති මුදල අඩුකර, ඉතිරි මුදලද එසේත් නැත්නම් මුළු මුදලද ඇප තැන්පත් මුදල සමග ආපසු ගෙවිය හැක. කෙසේ වුවද අවලංගු කරන ලද වෙන්කර ගැනීමට නිසා වෙනත් යම් ඉල්ලුම්කරුවෙකුට ක්‍රීඩා භූමි ලබාදීමට ප්‍රතික්ෂේප කිරීමට සිදුවූයේ නම්, ඇප තැන්පත් මුදල හැර වෙනත් කිසිම මුදලක් ආපසු ගෙවීමක් නොකළ යුතුය.

07. ක්‍රීඩාභූමි වෙන්කර ගන්නා කාර්යය හා වේලාව :-

(අ) අවසරපත්‍රය නිකුත් කරනු ලබන කාර්යය හැර වෙනත් කිසිම කාර්යයක් තුළදී අවසරපත්‍රලාභියා විසින් ක්‍රීඩාභූමිය ප්‍රයෝජනයට නොගත යුතුය. අවසරපත්‍රයේ ලිඛිතව සඳහන් කාලය තුළ පමණක් ක්‍රීඩාභූමිය ප්‍රායෝජනයට ගැනීමට අවසරපත්‍රලාභියෙකුට හිමිකම් තිබිය යුතුය.

(ආ) අවසරපත්‍රයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඉකුත්වූ විට සභාපතිවරයා හෝ ඔහු විසින් නිසි බලය දෙන ලද නිලධාරියෙකුට ක්‍රීඩාභූමිය පරිහරණය කරන අතිරික්ත කාලපරිච්ඡේදය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ තෙවන අතුරු ව්‍යවස්ථාව අනුව, නිශ්චිතව සඳහන් ගාස්තු ප්‍රමාණවලට අමතරව සභාව විසින් තීරණය කරන ප්‍රකාශයට පත් කරන්නට යෙදී ඇති අතිරේක ගාස්තු ගෙවීමට යටත් වන්නේය.

(ඇ) එම ගාස්තු ඔහුගේ ඇප තැන්පතුවෙන් අඩුකර ගත යුතුය. සභාපතිවරයා විසින් නිසි ලෙස දෙනලද බලය මත යම් නිලධාරියෙකුට අවශ්‍ය වන විටක පරීක්ෂා කිරීම සඳහා අවසරපත්‍රධාරියා විසින් එම අවසරපත්‍රය ඉදිරිපත් කළයුතු අතර, එම අවසරපත්‍රය එම නිලධාරියාට ඉදිරිපත් කරනු නොලැබුවහොත් අවසරපත්‍රලාභියාට ක්‍රීඩාභූමිය ප්‍රායෝජනයට ගැනීමට ඉඩ නොදිය යුතුය.

08. තෙවන අතුරු ව්‍යවස්ථාව අනුව සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන අවසරපත්‍රයක් අවසරපත්‍රධාරියා විසින් අන්සතු නොකළ යුතුය.

09. බලපත්‍රලාභයා විසින් සභාව සතු දේපළ හා උපකරණ ආරක්ෂා කිරීමට බැඳී සිටිය යුතුය. දේපලවලට හා උපරකණවලට යම් හානියක් සිදුවී ඇත්නම් ඒවා යථා තත්ත්වයට පත්කර ආපසු භාරදිය යුතුය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ක්‍රියා නොකරන්නේ නම්, සභාපතිවරයා විසින් ගණනය කරනු ලබන අලාභය ඇප මුදලින් අයකර ගැනීමේ බලය සභාව සතුය.

11. බලපත්‍රයේ සඳහන් ක්‍රියාකාරකම්වලදී බලපත්‍රලාභියාට හෝ වෙනත් යම් පාර්ශවයකට සිදුවන අලාභ හෝ ආපදා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

12. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩකිරීමක් හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක දණ්ඩනයේ උපරිමය පිළිවෙලින් 255 වන අධිකාරය වන ප්‍රාදේශීය සභා ආඥා පනතේ 153 වගන්තියේ (2) වන උපවගන්තිය අනුව නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිම විය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය ලත් නිලධාරියා" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

11 - 408/3

---

**පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය උ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම පළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. කිසියම් තැනැත්තෙකු විසින් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ගෙන් ලබාගත් බලපත්‍රයක් යටතේ හැර කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන නොයා යුතුය.

04. තුන්වන අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම සභාපතිවරයා විසින් කලින් අවලංගු කරනු ලැබූවහොත් මිස එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන්ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් විය යුතුය.

05. (අ) මෙම අතුරු ව්‍යවස්ථාවේ (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් කියමන් ඒ ආකාරයෙන්ම සම්පූර්ණ කර ඇත්තේ නම් මිස පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් කොණ්ඩා සකසන ස්ථාන බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානයකට බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(ආ) කොණ්ඩා සකසන ස්ථාන බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට අදහස් කරන ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස

i. ශක්තිමත්ව නිමකර තිබිය යුතුය අතර එක් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීම සඳහා වෙන්කර ඉඩ ප්‍රමාණය අවම වශයෙන් වර්ග මීටර් 1.5 නොඅඩු වනසේ එකවර සේවා සපයන ගණුදෙනුකරුවන් සංඛ්‍යාවට අනුරූපීව ප්‍රමාණවත් ඉඩ කඩ සපයා තිබිය යුතුය.

ii. සේවා සපයා ගැනීමට බලාපොරොත්තුවෙන් පැමිණෙන කිසියම් ගණුදෙනුකරුවෙකුට සේවා ලබාගන්නා ගණුදෙණුකරු ස්ථානගත කර ඇති ස්ථානයේ සිට අවම වශයෙන් මීටර් 1.5 ක් දුරින් වන සේ පහසුවෙන් අසුනගෙන රැඳී සිටීමට ප්‍රමාණවත් ඉඩ කඩ සපයා තිබිය යුතුය.

iii. ඇතුළත බිත්ති ශක්තිමත් ද්‍රව්‍යවලින් තිබිය යුතු අතර තීන්ත ආලේප කර තිබිය යුතුය.

iv. ඇතුළත වහලය ලී හෝ වෙනත් ශක්තිමත් ද්‍රව්‍යකින් තනා තිබිය යුතු මෙන්ම අවම වශයෙන් පොළව මට්ටමේ සිට මීටර් 2.25 ක් උස සිවිලිමකින් යුක්ත විය යුතුය. තවද සිවිලිම සුදු පාටින් පින්තාරු කර තිබිය යුතුය.

v. ඇතුළත පොළව සිමෙන්තියෙන් මැද හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු අතර බිත්තිය හා පොළව සම්බන්ධ වන ස්ථානය පිරිසිදු කිරීමට පහසු වන සේ වටකුරු හැඩයට සකස් කර තිබිය යුතුය.

vi. අතුළත වායු සමීකරණය කර නොමැති ගොඩනැගිල්ලක් වන විට එහි භූමියේ වර්ග ප්‍රමාණයෙන් පහළොවෙන් එකකට නොඅඩු වා කවුළු සවිකර තිබිය යුතු අතර ප්‍රමාණවත් ආලෝකය ලැබීමට සලස්වා තිබිය යුතුය.

vii. ඇතුළත වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක් වන විට ප්‍රමාණවත් විදුලි ආලෝකය සපයා තිබිය යුතුය.

viii. ගණුදෙනුකරුවන්ට සේවා සැපයීමේදී සේදීම සඳහා ජලය භාවිතා කරන්නේ නම් සෝදන බේසම් සවිකර තිබිය යුතු අතර පාවිච්චි කල අප ජලය ගලායාමට ප්‍රමාණවත් නල සවිකර තිබිය යුතුය.

ix. ඇතුළත භාවිතා කර බැහැර කරන අප ජලය උරාගැනීමේ වළකට ගලායාමට සලස්වා තිබිය යුතු අතර පොදු ජල මාර්ගයකට ගලායාමට සැලැස්වීම නොකළ යුතුය.

x. ඇතුළත හෝ පරිශ්‍රය ඇතුළත ජලමුද්‍රිත වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

xi. ඇතුළත නිවාසයක කාර්යය සඳහා යොදාගැනීම නොකළ යුතු අතර නිවාසය සඳහා යොදාගන්නා කොටසින් වෙන්කර තිබිය යුතුය.

(ඇ) කොණ්ඩා සකසන ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන

i. ගණුදෙනුකරුවන් සඳහා විවෘතව තබන සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් ජල සම්පාදනයක්

ii. පවත්වාගෙන යාමේදී පාවිච්චි කරන උපකරණ හා මෙවලම් ජීවානුහරණය සඳහා ප්‍රමාණවත් වන ජලය උතුරුවන ක්‍රමයක් හෝ ජීවානුහරණ ක්‍රමයක් සහ ජීවානුහරණය සඳහා භාවිතා කෙරෙන බඳුන් ප්‍රමාණවත් සංඛ්‍යාවක්

iii. ඇතුළත සේවා සපයන්නන්ට ඔවුන්ගේ වැඩකරගෙන යාමේදී අත් සෝදාගැනීමේ පහසුකම් සහිත බේසම් හා සබන් හෝ සබන් දියර

iv. ගණුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා සුදු පැහැයෙන් යුක්ත වන තුවා හා උඩුකය ආවරන වැස්ම ප්‍රමාණවත් සංඛ්‍යාවක්

v. ඇතුළතදී කපන ලද කෙස් හා වෙනත් අපද්‍රව්‍ය දැමීම සඳහා හොඳින් වැසුණු පියනකින් යුත් එහා මෙහා ගෙන යා හැකි භාජනයක්

vi. අතුළත විදුලියෙන් ක්‍රියාත්මක කරන උපකරණ යොදාගන්නේ නම් එක් ගණුදෙනුකරුවෙකුගේ මේසයට අවම වශයෙන් එකක් බැගින් වනසේ ආරක්ෂිත විදුලි පේනු එකක් බැගින්

vii. සභාපතිවරයා විසින් නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රමාණවත් ප්‍රථමාධාර උපකරණ හා ඖෂධ සහිත ප්‍රථමාධාර පෙට්ටියක් සපයා තිබිය යුතුය.

06. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් ලත් සෑම ස්ථානයකම සේවයේ යොදවා ඇති තැනැත්තෙකුටම සභාපතිවරයා විසින් නිර්දේශ කරනු ලබන ප්‍රමාණයේ ප්‍රථමාධාර පුහුණුවක් හා අවම වශයෙන් වර්ෂයකට එක් වතාවක් බැගින් වන ප්‍රථමාධාර පෙරහුරුවක් ලබාදිය යුතුය.

07. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් හතරවන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ සඳහන් ආකාරයට බලපත්‍රලත් ස්ථානයේ තීන්ත ආලේප කර තිබිය යුතු යැයි නියම කර ඇති ස්ථාන අවම වශයෙන් වර්ෂයකට එක් වගාවක් බැගින් තීන්ත ආලේප කළ යුතුය.

08. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් සෑම තැනැත්තෙකුම විසින් බලපත්‍රලත් ස්ථානයේ ගෙබිම අවම වශයෙන් සතියකට වරක්වත් විෂබීජනාශක යොදා සෝදාහැරීම කළයුතුය.

09. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත දිවාකාලයේ හෝ රාත්‍රී කාලයේ නිදා ගන්නා හෝ ආහාර ගන්නා ස්ථානයක් ලෙස පාවිච්චි නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තෙකුට එසේ පාවිච්චි කිරීමට ඉඩ නොදිය යුතුය.

10. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලත් ස්ථානයක ඇතුළත ආහාර පිසීම හෝ ආහාර විකිණීම හෝ විකිණීම සඳහා ආහාර ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතුය.

(අ) කිසියම් ආසාදන ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාල සීමාව ඉකුත්වී ඇත්තේ නම් මිස කවර හෝ ආකාරයක කාර්යයක හෝ එසේ කාර්යයක නියුක්ත යම් තැනැත්තෙකුගේ සහායකුයෙකු වශයෙන් හෝ නියුක්ත වීම හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත විමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ආ) හොඳින් සෝදා පිරිසිදු කල ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින්, බලපත්‍රයක් ස්ථානයක කවර හෝ ආකාරයක කාර්යයක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ඇ) බලපත්‍රලත් ස්ථානයේ සේවයේ යොදවා ඇති සියලුම සේවකයින් අවම වශයෙන් වර්ෂයකට, එක් වතාවක් වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරවීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

11. කවර හෝ ආකාරයක හෝ ආසාදන හෝ ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන නැතහොත් එවැනි රෝගයකින් පෙළෙන තැනැත්තෙකුට මෑතකදී උපස්ථාන කල කිසියම් ගණුදෙනුකරුවෙකුට සේවා සැපයීමෙන් අනතුරුව

(අ) එකී සේවා සැපයීම කළ තැනැත්තා විශබීජ නාශක ද්‍රව්‍යක් යොදා තමාගේ දෑත් පිරිසිදු කරගෙන ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවෙකුට සේවය කිරීම හෝ සේවය කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

(ආ) එකී ගණුදෙනුකරුවා සඳහා පාවිච්චි කල කවර හෝ උපකරණයක් ජීවානුහරණය කර ඇත්තේ නම් මිස සහ පාවිච්චි කල තුවා සහ උඩුකය ආවරණ වැස්ම විෂබීජ නාශක සහ සබන් යොදා සෝදා ඇත්තේ නම් මිස වෙනත් යම් ගණුදෙනුකරුවෙකු වෙනුවෙන් පාවිච්චි කිරීම හෝ එසේ කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

12. බලපත්‍රලත් ස්ථානයේ සේවයේ නියුක්ත කර ඇති සෑම සේවකයෙකුම -

(අ) දිනපතා දියනෑමෙන් හෝ ඇඟ සෝදාගැනීමෙන් අනතුරුව පමණක් සේවයේ නියුක්ත වන බවය

(ආ) අඳින ඇඳුම් හා පැළඳුම් පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂක තත්ත්වයෙන් වන බවට

(ඇ) නියපොතු කොටට කපා කුණුවලින් තොරව තබාගන්නා බවට සහ

(ඈ) එක් එක් ගණුදනුකරු සඳහා සේවය කිරීමට පෙරාතුව සබන් ගා අත් සෝදා ගන්නා බවට සහතික වීම බලපත්‍රලාභියාගේ වගකීම විය යුතුය.

13. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා -

(අ) උපකරණ පාවිච්චි කරන එක් එක් වතාවට පසුව ජීවානුහරණය කිරීම

(ආ) බුරුසු සහ පනා සෑම දිනයකම පාවිච්චියට ගැනීමට පෙර හොඳින් සෝදා පිරිසිදුකර ජීවානුහරණය කිරීම

(ඇ) සියලුම කතුරු, කෝප්ප සහ සබන් බුරුසු ඒවා ප්‍රයෝජනයට ගන්නා එක් එක් වතාවෙන් පසුව උණු වතුරෙහි ගිල්වා සෝදාහැරීම කරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

14. බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා එක් එක් ගණුදෙනුකරුගේ -

(අ) කොණ්ඩය හෝ රැවුල කැපීමෙන් ඉවත් කරන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන උරාගන්නා යන්ත්‍රයක් මගින් හෝ එකතු කර ඒ සඳහා වෙන්කළ භාජනයට දැමීම කරන බවට සහ

(ආ) කොණ්ඩය හෝ රැවුල කැපීමට උපයෝගී කරගන්නා තල මාරුකළ හැකි දැලි පිහියේ තලය මාරුකරන බවට බලපත්‍රලාභියා සහතික විය යුතුය.

15. දෛනික කටයුතු අවසානයේ හෝ අවශ්‍ය වන්නේ නම් දිනකට කිහිප වතාවක් බැගින් ඉවත් කරන කෙස් කැබලි ඇතුළත් බඳුනේ ඇති අපද්‍රව්‍ය අවම වශයෙන් පොළවෙන් මීටර එකකට නොඅඩු ගැඹුරකින් වළදැමීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේය. එසේම ඉවත දමන කෙස් කැබලි හෝ වෙනත් අපද්‍රව්‍ය සුළඟේ ගසාගෙන යාම හෝ පරිශ්‍රය තුල යම් පොදු ස්ථානයක විසිරී යාම වැළැක්වීමට ක්‍රියාකිරීමද බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

16. බලපත්‍රලත් ස්ථානයේ රැස්කරන කෙස් කැබලි සහ වෙනත් අපද්‍රව්‍ය 15 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයට බැහැර කිරීමට නොහැකි වන අවස්ථාවකදී ප්‍රාදේශීය සභාවේ අපද්‍රව්‍ය කළමනාකරන වැඩපිළිවෙල යටතේ නියම කරනු ලබන ආකාරයෙන් ප්‍රාදේශීය සභාවේ කසල රැස්කිරීමේ වාහනයකට භාරදීමට ක්‍රියාකළ යුතුය.

17. බලපත්‍රලත් ස්ථානයේ පාවිච්චියට ගන්නා අපද්‍රව්‍ය රැස්කිරීමේ භාජනය හිස් කිරීමෙන් පසු පිරිසිදු කර විෂබීජ නාශක යෙදීමට සැලැස්වීම බලපත්‍රලාභියාගේ කාර්යය විය යුතුය.

18. කවර හෝ බලපත්‍රලත් ස්ථානයක -

(අ) කවර ආකාරයෙන් හෝ ලේ නවත්වන පැන්සල් වර්ගයක් හෝ පියරු මලක් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් හෝ

(ආ) යම් ලේ ගැනීමක් නතර කිරීමේ කාර්යය සඳහා සීනක්කාරම් හෝ වෙනත් ද්‍රව්‍යවක් (එය කුඩු වශයෙන් හෝ දඩ වශයෙන් ඇත්නම් මිස) කිසිම ගණුදෙනුකරුවෙකු සඳහා පාවිච්චි කිරීම හෝ පාවිච්චි කිරීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

19. බලපත්‍රලත් ස්ථානයක බලපත්‍රලාභියා විසින් පිරිසිදු තත්ත්වයෙන් නොමැති උඩුකය ආවරණ වැස්මක් හෝ සෝදනු ලැබීමෙන් පසු පළමු වරට පාවිච්චි කරන තුවායක් නොවන තුවායක් හෝ කවර හෝ ගණුදෙනුකරුවෙකුගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම නොකළ යුතුය.

20. මේ කොටසේ අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රලත් ස්ථානයකට නිකුත් කරන ලද බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කවර හෝ කාර්යයන් සභාපතිවරයාගේ ලිඛිත අවසරය ඇත්තේ නම් මිස නොකළ යුතුය.

21. සභාපතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් පොදුවේ හෝ විශේෂයෙන් ලියවිල්ලක් මගින් බලය දෙන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්ථාන වලට යුක්ති සහගත වේලාවන් හිදී ඇතුල්වීම පරීක්ෂා කිරීම නීත්‍යානුකුල වන අතර ඒ සඳහා අවශ්‍ය විය හැකි සියල සහය බලපත්‍රලාභියා හෝ එය භාරව සිටින තැනැත්තන් විසින් ලබාදිය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද,

"උඩුකය ආවරණ වැස්ම" යන්නෙන් බලපත්‍රලත් ස්ථානයේ සේවය ලබාගන්නා කිසියම් ගණුදෙනුකරුවකුගේ උඩුකය ආවරණය කිරීමට පාවිච්චි කරන ආවරණ රෙද්දක් අදහස් වේ.

23. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

11 - 408/4

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**අයාලේ යන සතුන් අල්ලා ගැනීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අයාලේ යන සතුන්ගෙන් වන හානි වළක්වා ගැනීම සඳහා හා එකී සතුන් අල්ලා ගැනීම හා ඊට අදාළ ආනුෂාංගික විධිවිධාන වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. සභාපතිවරයා විසින් නිශ්චිතව බලය පැවරූ පුද්ගලයෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු ස්ථානයක අයාලේ යන සතෙකු අල්ලා ගැනීම එම සතුන් තමන් භාරයට ගැනීම සිදුකළ හැකිය.

03. දෙවන අතුරු ව්‍යවස්ථාව යටතේ අල්ලා ගනු ලබන සතුන් රැකවල්කාරයෙකු භාරයට ගෙන හැකිතාක් ඉක්මනින්න ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන සත්ව ගාලක් වෙත ගෙන යා යුතුයි.

04. කවර හෝ තැනැත්තෙකු විසින් ඉහත දෙවන අතුරු ව්‍යවස්ථාව අනුව බලයලත් අයෙකුගේ රාජකාරී ඉටුකිරීමේදී ඊට බාධා කිරීම හෝ නුසුදුසු ලෙස මැදිහත්වීම සිදු නොකළ යුතුය.

05. මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් රැකවල්කර විසින් ගාල තුලට භාරගන්නා ලද සතුන් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර එය උපලේඛන අංක 01 පරිදි විය යුතුය.

06. ගාල් කරන ලද සතුන්ට වන හානි සඳහා සභාව වගකියනු නොලැබේ.

07. ගාල් කර ඇති සතෙකු නිදහස් කරගැනීම සඳහා එම සතා ඇල්ලීමට දැරූ වියදම, රැකවල් ගාස්තුව, ආහාර ගාස්තුව, රෝගී අවස්ථාවන් හිදී ප්‍රතිකාර ගාස්තු වශයෙන් ගණන් බැලූ ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලැබූ මුදලක් සතාගේ හිමිකරු/භාරකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවා කුවිතාන්සියක් ලබාගත යුතුය.

08. සභාපතිවරයා හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සතුන් නිදහස් කිරීමේ නියෝගයක් නොමැතිව කිසිම සතෙකු නිදහස් නොකළ යුතු අතර නිදහස් කිරීමේ නියෝගයේ සඳහන් අයටම සතුන් භාරදිය යුතුය.

09. හිමිකරුවෙකු, භාරකරුවෙකු ඉදිරිපත් නොවන්නා වූද නියමිත ගාස්තු ගෙවා නොමැති වූද, අල්ලා ගත් දින සිට දින 10කට නොඅඩු කාලයක් ගාල තුල තබා සිටියාවූද කවර හෝ සතෙකුගේ හිමිකම එනයින්ම සභාව සතු වන අතර සභාවට අයවිය යුතු මුදල් ලබාගැනීම සඳහා සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙන්දේසියේ විකිණීම නීත්‍යානුකුල වන්නේය.

10. 09 වන අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව විසින් මස් පිණිස සතුන් වෙන්දේසි කිරීම නොකළ යුතුය.

11. වෙන්දේසි කිරීමෙන් ලබාගන්නා මුදලෙන් ප්‍රාදේශීය සභාවට අයවිය යුතු ගාස්තු පියවා ගත් පසු ඉතිරියක් වේ නම් එය නියම හිමිකරු, භාරකරු ඉල්ලා සිටියහොත් ඔහුට ලබාදිය යුතුයි. වෙන්දේසියෙන් මාස 06ක කාලයක් ඉකුත්වීමෙන් පසු ලැබෙන එවැනි ඉල්ලීම් භාර නොගත යුතු අතර එම ශේෂ මුදල සභාවේ පොදු අරමුදලට බැරකළ යුතු වන්නේය.

12. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම් හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තිය අනුව නියම කළ හැකිය. මේ යටතේ අයකරනු ලබන සියලුම දඩ මුදල් ප්‍රාදේශීය සභා අරමුදලට බැරකළ යුතුයි.

13. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,
"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද,
"අයාලේ යන සතුන්" යන්නෙන් යම්කිසි පොදු ස්ථානයක ගැවසෙන ගවයකු, ඌරකු, අශ්වයෙකු, පෝනියෙකු, එළුවෙකු අදහස් වේ.

14. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

උපලේඛන අංක 01

| *දිනය* | *සතුන්ගේ විස්තර (වර්ගය/පාට)* | *සතුන් ප්‍රමාණය* | *භාරදුන් නිලධාරියාගේ අත්සන* | *භාරගත් නිලධාරියාගේ අත්සන* |
|---|---|---|---|---|
| | | | | |

11 - 408/5

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**ප්‍රාදේශීය සභා සීමාව තුළ පොදු නාන ස්ථාන පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු නාන ස්ථාන පාලනය කිරීමේ හා විධිමත් කිරීමේ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පොදු නාන ස්ථාන පාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

03. සෑම නාන ළිඳික්ම විධිමත්ව පවත්වාගෙන යාම එම නාන ළිඳ ප්‍රයෝජනයට ගන්නා ගම්වැසියන්ගේ නියෝජනයෙන් සමන්විත වූ කමිටුවක් මගින් සිදුවිය යුතුය.

04. එකී කමිටුව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි වියයුතු අතර කමිටුව තීරණය කරනු ලබන සුළු සාමාජික මුදලක් සාමාජිකයන්ගෙන් අයකර කමිටුව මගින් ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කළ යුතුය. සභාව තිරණය කරනු ලබන මුදලක් එම ගිණුමට ලබාදිය හැක. එම මුදල් ළිඳේ ප්‍රයෝජනය සඳහා ආපසු ගැනීම කමිටුවේ අභිමතය පරිදි කමිටුවේ සභාපති හා ලේකම් කළයුතු අතර මුදල් වියදම් කිරීම පිළිබඳ හා ගාස්තු අයවීම් පිළිබඳ මාස 06 කට වරක් සභාවට දැන්වීම කමිටුවේ වගකීම විය යුතුය.

05. තුන්වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කමිටුව ළිඳ විධිමත්ව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කාර්යයන් කළ යුතුය.

i. නාන ළිඳ සඳහා බාල්දියක් සහ ලණුවක් අවශ්‍ය පරිදි යෙදීම
ii. එම බාල්දිය මාස 06 කට වරක් තීන්ත ආලේප කර පවිත්‍ර කිරීම
iii. ළිඳේ පිරිසිදු වූ ජලය සෑම මාස 06 කට වරක් හිස්කර ළිඳ පිරිසිදු කිරීම
iv. ළිඳේ ජල මූලාශ්‍රය හා ළිං පරිශ්‍රයේ තිබෙන ගස් කොලන් ආරක්ෂා කිරීම

06. ජලය ස්නානය කිරීමේ කාර්ය සඳහා යොදාගන්නා සෑම ළිඳක්ම මීටර් 0.6096 නොඅඩු උසකින් යුත් ආරක්ෂිත තාප්පයක් සහිත විය යුතු අතර, එම තාප්පය පිටත පොළව මට්ටමෙන් පහතට මීටර් 0.6096 ක් ගැඹුරට සිමෙන්ති යොදා තිබිය යුතුය.

07. සෑම පොදු ළිඳක් වටා ආසන්නව ඇති භූමිය ජලය පොළවට උරා නොගෙන ගලායන ආකාරයට ඉදිකර ඇති කාණුවකට බැස යන පරිදි සකස්කර තිබිය යුතුය.

08. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් එක් පක්ෂයක ප්‍රයෝජනය සඳහා ප්‍රාදේශීය සභාව විසින් නානා ස්ථානයක් වශයෙන් වෙන්කොට ඇති අවස්ථාවක හෝ ඇඳුම් මාරුකිරීම සඳහා ස්ත්‍රී පුරුෂ ලෙස වෙන්කොට ඇති ස්ථානයක අනෙක් පාර්ශවයට අයත් කිසිම තැනැත්තෙකු විසින් ප්‍රයෝජනයට නොගත යුතුය.

09. බෝවන රෝගයකින් පෙළෙන හෝ එවැනි රෝගයකින් මෑතකදී සුවය ලැබූ කිසිම තැනැත්තෙකුටම එවැනි යම් පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක නෑම සේදීම හෝ එහි ජලය කවර ආකාරයකින් හෝ ප්‍රයෝජනයට ගැනීම නොකළ යුතුය.

10. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති කවර හෝ ස්ථානයකින් පානය කිරීම සඳහා ජලය ලබා නොගත යුතුය.

11. පොදු නාන ස්ථානයක් වශයෙන් වෙන්කර ඇති කවර හෝ ස්ථානයක හෝ ඒ ආසන්නයේ කිසිම ගවයෙකු එළුවෙකු, ඌරකු, කොටලුවෙකු, පෝනියෙකු සුනඛයෙකු හෝ වෙනත් යම් සතෙකු සේදීම හෝ කවර හෝ කාර්යයක් සඳහා එවැනි ස්ථානයකට සතෙකු ඇතුල් කිරීම හෝ පැන්නීම කිසිම තැනැත්තෙකු විසින් නොකල යුතුය.

12. එවැනි යම් පොදු ළිඳක් හෝ ඒ ආසන්නයේ හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක මලපහ කිරීම හෝ මුත්‍රා කිරීම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

13. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක වාහන සේදීම හෝ එවැනි කාර්යයකට ජලය ලබාගැනීම හෝ නොකළ යුතුය.

14. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක කෘෂි රසායනික ඉසීමට ගන්නා උපකරණ සේදීම හෝ කෘෂි රසායනික ද්‍රව්‍ය ජලයේ දියකිරීම සඳහා ජලය ප්‍රයෝජනයට ගැනීම හෝ නොකළ යුතුය.

15. එවැනි පොදු ළිං පරිශ්‍රයක් තුළ හෝ ළිඳ පිහිටි ස්ථානයට ආසන්නව අසංවරව හැසිරීම නොකළ යුතුය.

16. පොදු ළිඳක් ජලය ස්නානය කිරීමේදී ළිඳට බැස ජලය ස්නානය නොකළ යුතු අතර යම් ආකාරයකින් ජලය අපවිත්‍ර වීමට සැලැස්වීම නොකළ යුතුය.

17. පොදු ළිඳක් හෝ නාන ස්ථානයක් වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් වෙන්කර ඇති යම් ස්ථානයක විධිමත් පරිදි කටයුතු කෙරෙන්නේද යන්න පරීක්ෂා කර බැලීම සඳහා සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල විය යුතුය.

18. ඉහතින් දැක්වූ අතුරු ව්‍යවස්ථා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඩය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තිය අනුව නියම කළ හැකිය.

19. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,
"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"බලය පවරනු ලැබූ නිලධාරියා" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා ද අදහස් වේ.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

11 - 408/6

---

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර විධිමත් කිරීම අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අයකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිනිස මෙම අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර, කිසිම තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ උපලේඛන වල දැක්වෙන පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතුය.

03. කලින් අවලංගු නොකළහොත් මිස එවැනි සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා බල පැවැත්විය යුතුය.

04. ව්‍යාපාරයේ පරිශ්‍රය සහ එම කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම් එම ගොඩනැගිල්ල පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් නොලබන්නේය.

(අ) පරිශ්‍රය හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයකින් සහ මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතු අතර, සෑම කාමරයක් විවෘත කළවිට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ජනේල් සවිකර තිබිය යුතුය.

(ආ) සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 214 ට නොඅඩු වියයුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල් වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාදු කොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාදු කොට වර්ණ ආලේප කර තිබිය යුතුය.

(ඇ) සෑම පියසි කෙළවරකම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

(ඈ) වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(ඉ) දැව කර්මාන්ත සියල්ල තෙල් සායම් ගා හෝ හුණු ගා තිබිය යුතුය.

(ඊ) සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් තනවා තිබිය යුතුය.

(උ) පරිශ්‍රය ප්‍රමාණවත් ජලවහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

(ඌ) පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසල භාජන සහ ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සපයා තිබිය යුතුය.

05. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩාකර තැබිය යුතුය.

06. බලපත්‍රධාරියෙකු විසින් පීඩා ඇතිවීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවත් ඔස්සේ රැගෙන යාමේදී කිසිදු පීඩාවක් ඇති නොවන සේ ආවරණය කරන ලද. උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

07. සෑම බලපත්‍රධාරියෙකුම, යම් කිසි නිෂ්පාදන ක්‍රියාවලියකදී විමෝචනය වන පීඩාකාරී ශබ්ද වාෂ්ප හෝ වායු ඒවා විහිදී යාමේදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හෝ උසකින් වායුගෝලයට මුදාහැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ සනීකරණ උපකරණයකින් තුලින් පිටවීමට සැලැස්විය යුතුය.

08. සෑම බලපත්‍රධාරියෙකුම, තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළයුතු අතර ඒවා දිනපතා සේදීම කළ යුතුය.

09. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම යම් අපාරගම්‍ය ද්‍රව්‍යකින් ඉදිකරවිය යුතු අතර හොඳ ප්‍රතිසංස්කරණ තත්ත්වයෙන් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

10. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාර කරගෙන යනු ලබන කාලයේදී, වාර්ෂිකව එම පරිශ්‍රයේ වර්ණ ආලේප කළ යුතුය.

11. සෑම බලපත්‍රධාරියෙකුම, ව්‍යාපාරික කටයුතුවලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියලු ආම්පන්න පිරිසිදු කර තබාගත යුතුය.

12. සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරිය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසල, අතුගා එකතු කරනු ලබන බොල් රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන ඒවා තවදුරටත් ව්‍යාපාර කටයුතු වලට වහාම නොයොදවන්නේ නම්, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ප්‍රාදේශීය සභාවේ නියමය පරිදි ඉවත් කළ යුතුය.

13. සෑම බලපත්‍රධාරියෙකුම හම් හෝ වෙනත් ද්‍රව්‍යයකින් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි, දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍ය වන පරිදි හිස්කර පවිත්‍ර කළ යුතුය.

14. සෑම බලපත්‍රධාරියෙකුම යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක් හෝ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ පීඩාකාරී ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ පීඩාකාරී ද්‍රව්‍යයකින් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

15. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු විසින් රාජකාරි වේලාවන් තුළදී පීඩාකාරී ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාරයක් කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළුවී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේය. තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේය.

16. බලපත්‍ර පරිශ්‍රයක් මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන වලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක යථෝක්ත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන්, නියමිත කාලයක් ඇතුළත දී ඉටුකරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත්තේය. තව ද, යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියාකළ යුතුය. එසේ ක්‍රියා නොකරන්නේ නම්, එවැනි අවස්ථාවක බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

17. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් වයාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් ලැබී දින 30 ක් ඇතුළත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට හේතු ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ කාර්ය වන්නේය.

18. සෑම බලපත්‍රලාභියෙකු විසින්ම බලපත්‍රය සහ බලපත්‍රයට අදාළ කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ සේවා නියුක්තිකයන්ගේ නම් සහ ලිපිනයන් සිංහල හා දෙමළ භාෂාවලින් දැක්වෙන ලැයිස්තුවක් බලපත්‍රලාභි ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඉල්ලා තැබීමට සැලැස්විය යුතුය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම දැන්වීමක්ම අවස්ථාවෝචිත පරිදි අයිතිකරු හෝ එම ස්ථානයේ භාරකරු වෙත භාරදිය යුතුය. එවැන්නෙකු නොමැති විට බලපත්‍රලාභී ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි එල්ලා තැබිය යුතුය. එවැනි දැන්වීමකට ස්ථානයේ අයිතිකරුගේ හෝ පරිහරණය කරන අයගේ නම සඳහන් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

20. මෙම ආඥා පනේත 164 වගන්තිය යටතේ බලපත්‍රයක් අවශ්‍ය වන්නාවූ කර්මාන්ත හෝ ව්‍යාපාර කිහිපයක් එකම ස්ථානයක පවත්වාගෙන යන්නාවූ අවස්ථාවක ඒ එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ පවේච්චි කරන නැතහොත් වෙන්කර ඇති භූමි වර්ග ප්‍රමාණය අනුව බලපත්‍ර ගාස්තු වෙන් වශයෙන් අයකළ යුතුය.

21. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩකිරීමෙන් හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් ඒ වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඩය සහ එම කඩකිරීම හෝ උල්ලංඝනය නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙන් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනයක් සඳහාම නියම කළහැකි අතිරේක දණ්ඩනයේ උපරිම පිළිවෙලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියේ (2) වන උප වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු අදහස් කරනු ලැබේ.

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද ඇතුළත් වේ.

"පාලනය භාර තැනැත්තා" යන්නට භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපල ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමනාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකුද ඇතුළත් වේ.

"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"ප්‍රාදේශීය සභා ප්‍රදේශය" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වේ.

"බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙක්" යන්නෙන් සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමට බලය පවරනු ලබන නිලධාරියා හෝ නිලධාරීන් අදහස් වේ.

20. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

*පළමුවන උපලේඛනය - පීඩාකාරී ව්‍යාපාර*

1. පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
2. සම් පදම් කිරීම
3. සම් විකිණීම
4. සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
5. ඡායාරූප ශාලාවක් පැවැත්වීම
6. පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම
7. විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම
8. කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබාගැනීම
9. පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබාගැනීම
10. දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
11. සත්ව ආහාර නිපදවීම හෝ සත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම
12. පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. සබන් නිෂ්පාදනය කිරීම
14. සත්ව ඇටකටු ඇඹරීම හෝ තබාගැනීම
15. අලුත් හෝ පරණ ලෝහ ගබඩාකර තබාගැනීම
16. ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
17. ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම
18. වේවැල් භාණ්ඩ නිපදවීම
19. වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
20. සිරප් හෝ පලතුරු බීම වර්ග නිපදවීම
21. රසකැවිලි වර්ග නිපදවීම
22. පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)
23. බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)
24. දත් බුරුසු නිපදවීම
25. රා එකතු කිරීම
26. විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම
27. යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දැව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම
28. පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම
29. සෝඩා නිපදවීම
30. සම් භාණ්ඩ නිපදවීම
31. පලතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇතිරීම
32. මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම සඳහා ඇඹරුම්හලක් පැවැත්වීම
33. ඉටිපන්දම් නිපදවීම
34. කපුරු නිපදවීම
35. ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම
36. රෙදි සෝදන නිල් නිපදවීම
37. ලාකඩ නිපදවීම
38. සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩාකිරීමේ ස්ථානයක් පැවැත්වීම
39. පාසැල් රටහුණු නිපදවීම
40. ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
41. ටයර් නැවත පිරවීම
42. ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති කිලෝග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම
44. සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම
45. ප්ලාස්ටික් භාන්ඩ නිපදවීම
46. යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම
47. පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම
48. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම
49. ධාන්‍ය හෝ මාෂබෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම

*දෙවන උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර*

1. තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම
2. මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම
3. මුද්‍රණාලයක් පැවැත්වීම
4. කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම
5. එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම
6. ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම
7. දර ගබඩාවක් පැවැත්වීම
8. කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින්
9. සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල්බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකිරීම
10. අයිස්ක්‍රීම් නිෂ්පාදනය
11. පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
12. ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
13. කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
14. පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම
15. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම
16. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම
17. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම
18. හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩාකර තබාගැනීම
19. පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පැවැත්වීම
20. පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබඩාකර තබාගැනීම
21. විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම
22. ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම
23. පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම
24. ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබාගැනීම
25. දැව ගබඩා කිරීම

*තෙවන උපලේඛනය - පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර*

1. රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම
2. ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම
3. රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම
4. විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම
5. හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩා කිරීම
6. බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
7. මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම
8. වාත්තු මඩුවක් පවත්වාගෙන යාම
9. බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම
10. ගෑස් සිලින්ඩර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම
12. වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම
13. ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
14. කිලෝග්‍රෑම් 150 වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබාගැනීම
15. වෑල්ඩිං සඳහා ස්ථානයක් පැවැත්වීම
16. ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපලක් පැවැත්වීම
17. පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම
18. කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම
19. වායුසමනය යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම
20. විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අලුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම
21. කිරි ශීතකිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම

11 - 408/7
2 - PG 001809

**පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

අතුරු ව්‍යවස්ථා

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියේ (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (vii) උප වගන්තිය ඌ ඡේදය යටතේ ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය (1) වැනි උප වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍ය සරත් ඒකනායක වන මා විසින් අනුමත කරනු ලැබූ බවත් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට එකී අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බලපවත්වන බවත් මෙයින් නිවේදනය කරමි.

සරත් ඒකනායක,
මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය.

2013 මැයි මස 15 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

**සත්ව ගොවිපලවල් පාලනය කිරීම හා විධිමත් කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව**

01. මෙම අතුරු ව්‍යවස්ථාව පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මස් පිණිස, කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස පවත්වාගෙන යන්නාවූ සත්ව ගොවිපලවලින් හා ඒ සම්බන්ධ වූ ක්‍රියාවන් පාලනය කිරීම, පරිපාලනය කිරීම, අධීක්ෂණය විධිමත් කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම සත්ව ගොවිපලවල් මහජනතාවට හා පරිසරයට හානි නොවන ලෙස සෞඛ්‍යාරක්ෂිතව පවත්වාගෙන යාමටත්, පීඩාවන් හා වධහිංසා කිරීම්වලින් තොරව පිළිගත් ප්‍රමිතීන් මත සතුන් පාලනය කිරීම මෙම අතුරු ව්‍යවස්ථාව පැනවීමේ අරමුණ වේ.

03. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් මත හැර කිසිම තැනැත්තෙකු විසින් කවර හෝ සත්ව ගොවිපොලක් මස් පිණිස, කිරි ලබාගැනිම පිණිස හෝ බිත්තර ලබාගැනිම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස සත්ව ගොවිපලක් පවත්වාගෙන නොයා යුතුය.

04. දෙවන අතුරු ව්‍යවස්ථාව පරිදි නිකුත් කරන ලද බලපත්‍රයක් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස සෑම බලපත්‍රයක්ම එය නිකුත් කරන ලද්දේ යම් වර්ෂයක් සඳහාද එම වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනනෙන් අවසන් වන්නේය.

05. සෑම බලපත්‍රයක් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වගන්තිය ප්‍රකාරව අයකරනු ලැබේ. මෙම ගාස්තු සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකිය. එම සංශෝධිත ගාස්තු ගැසට් පත්‍රයේ පළකීමෙන් පසු වලංගු වන්නේය.

06. බලපත්‍රයක් ලබාගැනීමට අදහස් කරන යම් තැනැත්තෙකු විසින් බල ප්‍රදේශයට අදාළ පශු වෛද්‍යවරයාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. මෙම අතුරු ව්‍යවස්ථාවේ උපලේඛනයට සාරානුකූල වන පරිදි අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

07. සෑම සත්ව ගොවිපල බලපත්‍රයකම "බලපත්‍රලත් සත්ව ගොවිපල" යන පරිදි සහ බලපත්‍රධාරියාගේ නමද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලිව පින්තාරු කළ පුවරුවක් තමාගේ සත්ව ගොවිපොළෙහි පිට පැත්තේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සවිකර තැබිය යුතුය.

08. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ගොවිපොලෙහි බිත්ති හා කුළුණු වර්ෂයකට වරක් වර්ණ පිරියම් කිරීමට සැලැස්විය යුතුය.

09. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ගොවිපොල හා එහි සියලු ගොඩනැගිලි මනා අලුත්වැඩියාවෙන්ද පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන්ද තබාගැනීමට සහ එය දිනපතා සේදීමට සහ ඇමදීමට සැලැස්විය යුතුය.

10. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම ස්ථානය පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයෙන් තබාගත හැකි වනු පිණිස සියලු සත්ව මල මුත්‍රා හා වෙනත් අපද්‍රව්‍ය දිනපතා වරින් වර හා කෙටි කාලසීමාවකට වරක් බැගින් එකතු කිරීමට සැලැස්විය යුතු අතර, එසේ එකතු කරන සත්ව මල මුත්‍රා හා අපද්‍රව්‍ය යම් ස්ථිර ද්‍රව්‍යයකින් තැනූ ආවරණය කරන ලද භාජනයකට හෝ සිමෙන්ති බධාමයෙන් බැද' කපරාරු කරන ලද ප්‍රමාණවත් ඉඩ පහසුකම් ඇති වළකට දැමිය යුතුය.

11. සෑම සත්ව ගොවිපල බලපත්‍රධාරියෙකුම සියලු අපද්‍රව්‍ය මූත්‍රා හෝ සේදූ ජලය දිනකට යටත් පිරිසෙයින් එක් වරක් වත් ඉවත් කර ඒවා මගින් පීඩාවක් ඇති නොවන පරිදි ඒවා බැහැර කිරීමට සැලැස්විය යුතුය.

12. සෑම සත්ව ගොවිපොල බලපත්‍රධාරියෙකුම අවම ලෙස මාස 03 කට වරක් ගොවිපලේ සෑම සත්වයෙකුම රජයේ පශු වෛද්‍යවරයාගේ පරීක්ෂාවට ලක්කර ලබාගත් වාර්තාවක් තමා භාරයේ තබාගත යුතු අතර පශු වෛද්‍යවරයා විසින් යම් නිර්දේශයක් ලබාදී ඇත්නම් එය වහාම ක්‍රියාත්මක කළ යුතුය.

13. සත්ව ගොවිපොල තුළ සිටින සතෙකුට හෝ සතුන්ට යම් රෝගයක්, බෝවන රෝගයක් වංසගත තත්ත්වයක් ඇති වුවහොත් සත්ව ගොවිපොල තුළ එම සතුන් වෙන්කොට තැබීමට හැකි වන ලෙස ගොවිපොල නිර්මාණය කළ යුතුය.

14. ඉහත 13 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් තත්ත්වයක් ගොවිපොල තුළ ඇතිවුවහොත් එවැනි අවස්ථාවකදී ඒ බව ප්‍රදේශයේ පශු වෛද්‍යවරයාට ලිඛිතව දැනුම් දීමක් කළ යුතුය.

15. සත්ව ගොවිපොල තුළ සතුන් රඳවා තබා සිටින ස්ථානයකදී කිසිදු සතෙකු මැරීම හෝ සතෙකුට වධ හිංසා පැමිණවීම නොකළ යුතුය.

16. සත්ව ගොවිපොල තුළ යම් රෝගයකින් බෝවන රෝගයකින් හෝ වසංගත තත්ත්වයක් හේතුවෙන් මියයන යන සතෙකුගේ මස් මනුෂ්‍ය පරිභෝජනයට ලක්විය නොහැකි පරිදි විනාශ කළ යුතුය.

17. සභාපතිවරයා විසින් හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් සත්ව ගොවිපලකට යුක්ති සහගත වේලාවන් තුළ ඇතුළු වී එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය.

18. සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට ස්ථානයට ඇතුළු වී පරීක්ෂා කිරීමට බලපත්‍රධාරියා විසින් හෝ සත්ව ගොවිපල භාරව සිටින තැනැත්තා විසින් හෝ ඉඩදෙනු ලැබිය යුතු අතර, සභාපතිවරයා හෝ එවැනි නිලධාරියෙකුට හෝ අවශ්‍ය විය හැකි සියලුම සහාය දිය යුතුය.

19. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට නියම කළ හැකි උපරිම දඬය හා එම කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම නොකඩවා තවදුරටත් කරගෙන යන විටක ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ උල්ලංඝනය ගැන අවධානය යොමුකරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදෙනු ලැබීමෙන් පසුව කඩකිරීම හෝ උල්ලංඝනය තවදුරටත් නොකඩවා කරගෙන යන සෑම එක් දිනක් සඳහාම නියම කළ හැකි අතිරේක උපරිම දඬය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තියෙන් නියම කර ඇති උපරිම දඩ මුදල හා අතිරේක දණ්ඩනයේ උපරිමය විය යුතුය.

20. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවේ —

"සභාපති" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"සභාව" යන්නෙන් පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව අදහස් වේ,
"බලය ලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු ද,
"සතුන්" යන්නෙන් මස් පිණිස හෝ කිරි පිණිස හෝ බිත්තර ලබාගැනීම පිණිස හෝ සත්ව අභිජනනය පිණිස ඇති කරන සත්ව කොට්ඨාසයන් අදහස් වේ.

21. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨයෙහි අර්ථ දැක්වෙන අදහස බලපැවැත්වේ.

***I* වන උපලේඛනය (හයවන අතුරු ව්‍යවස්ථාව)**

සත්ව ගොවිපල බලපත්‍රයක් ලබාගැනීම සඳහා වන අයදුම්පත්‍රය

1. අයදුම්කරුගේ නම :—
2. අයදුම්කරුගේ ලිපිනය :—
3. දුරකථන අංකය :—
4. ගොවිපල පවත්වාගෙන යන ස්ථානයේ ලිපිනය :—
5. දිස්ත්‍රික්කය :—
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—
7. ගොවිපල පිහිටි ග්‍රාම නිලධාරි වසම / ගම :—
8. ඇති කරන සතුන් වර්ගය හා ප්‍රමාණයන් :—

| *අනු අංකය* | *වර්ගය* | *ප්‍රමාණය* | *සතුන් ඇති කරන අරමුණ මස් පිණිස/වෙනත් .......* | *සතුන් සඳහා වෙන් කරදී ඇති ඉඩ ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | ගවයන් | | | |
| 02 | එළුවන් | | | |
| 03 | ඌරන් | | | |
| 04 | කුකුළන් | | | |

9. ගොවිපලට යන මාර්ග විස්තරය :—

. ................................................................ ................................................................

දිනය අයදුම්කරුගේ අත්සන

10. ප්‍රාදේශීය සහා පරිසර නිලධාරි වාර්තාව :—
11. ප්‍රදේශයේ පශු වෛද්‍ය නිලධාරිගේ වාර්තාව :—

12. කාර්යාල ප්‍රයෝජනය සඳහා

පහත සඳහන් තොරතුරු හා වාර්තාව අනුව සත්ව පාලන ඒකකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි/නොකරමි.

................................................................ ................................................................

දිනය ලේකම්

සත්ව පාලන ඒකකයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාදීම අනුමත කරමි/නොකරමි.

................................................................ ................................................................

දිනය සභාපති

11 - 408/8

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.